සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

**තෙවන වාර පරීක්ෂණය - 2025**
**Third Term Test - 2025**

**10 ශ්‍රේණිය**

# චිත්‍ර - I

**කාලය පැය 01 යි**

නම/ විභාග අංකය:

- **ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.**
- **පහත සඳහන් ඡායාරූපය ඇසුරු කරගෙන අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවල හිස්තැන් පුරවන්න.**



(01) ඉහත රූපයේ දැක්වෙන ගොඩනැගිල්ල ..... නමින් හඳුන්වයි.

(02) ගම්පොළ යුගයේ ඉදි වූ මෙම නිර්මාණය ..... නම් වූ ගල්තලාවක් මත ඉදිකර ඇත.

(03) විශිෂ්ට චිත්‍ර නිර්මාණ රැසක් දක්නට ඇති මෙම විහාරය ඉන්දියාවේ ..... නම් ශිල්පියා විසින් ඉදිකර ඇත.

(04) මෙම නිර්මාණය ඉදිකිරීම සඳහා මාධ්‍ය ලෙස ..... යොදාගෙන ඇති අතර, අතීතයේ දී එය මහල් 4 කින් යුක්ත විය.

(05) මෙහි ප්‍රතිමා ගෘහයේ ඇති හිඳි බුද්ධ ප්‍රතිමාව වීරාසන ක්‍රමයට ..... මුද්‍රාවෙන් නිර්මාණය කර ඇත.

- **අංක 06 සිට 10 තෙක් දී ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

(06) කැළණි විහාර බිත්ති සිතුවම් නිර්මාණය කරමින්, ලංකාවට නව විහාර චිත්‍ර ශෛලියක් හඳුන්වා දීමට පුරෝගාමී වූ ශිල්පියා නම් කරන්න. .....

Past Papers Wiki

(07) කාන්තාවන් හතර දෙනෙකුගේ රූප, දෝලාවක හැඩයට සම්පිණ්ඩනය කොට කරන ලද නිර්මාණය හඳුන්වන නම කුමක් ද? .....

(08) මහනුවර යුගයේ දක්නට ලැබෙන කලාත්මක බවින් උසස්ම සඳකඩ පහණ හමුවන ස්ථානය කුමක් ද?

.....

(09) ඉන්දීය කලා නිර්මාණ අතර ඇති ලෝකඩ නළඟන රුව නම් නිර්මාණය හමු වූ ප්‍රදේශය කුමක් ද?
.....

(10) අනුරාධපුර යුගයේ උසස් ම කලාත්මක ලක්ෂණ සහිත වටදාගෙය කුමක් ද? .....

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට අදාළ නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(11) මහනුවර යුගයට අයත් දඹුලු විහාර සිතුවම්වල දැක්වෙන ඓතිහාසික සිදුවීමක් නොවන්නේ මින් කුමක් ද?

(1) විජයාගමනය (2) මහින්දාගමනය

(3) මාරපරාජය (4) එළාර දුටුගැමුණු යුද්ධය

(12) ගඩලාදෙනිය විහාරය ඉදිරිපිට ඇති, අඩි 12 ක් පමණ උස අඩිතාලමක් මත, හිඳි බුද්ධ ප්‍රතිමා සතරක් තැන්පත් කර, ගලින් නිම වූ ගෘහ 4 ක් ඇති ස්ථානය හඳුන්වන නම කුමක් ද?

(1) මහ අලුත් විහාරය (2) විජයෝත්පාය

(3) පශ්චිම විහාරය (4) දේවරාජ ලෙන

(13) ඇතැන්ස් ගුරුකුලය නම් සිතුවම නිර්මාණය කළ ශිල්පියා වන්නේ,

(1) රෆායල් සන්සියෝ ශිල්පියා ය. (2) ලියනාඩෝ ඩාවිංචි ශිල්පියා ය.

(3) ඩේවිඩ් පේන්ටර් ශිල්පියා ය. (4) මයිකල් ආන්ජලෝ ශිල්පියා ය.

(14) ජනක රත්නායක මහතාගේ නිර්මාණයක් නො වන්නේ මින් කුමක් ද?

(1) සාරංගා (2) කබලෙන් ලිපට

(3) සුසීමා (4) ඉන්දු

(15) ෆැන්සිස්කෝ ජියෝකොන්ඩා නැමති වෙළෙඳ ව්‍යාපාරිකයාගේ බිරිඳ වූ ලීසාගේ උඩුකය රුව සිතුවමට නැගූ ශිල්පියා වන්නේ

(1) රෆායල් සන්සියෝ ශිල්පියා ය. (2) ලියනාඩෝ ඩාවිංචි ශිල්පියා ය.

(3) ඩේවිඩ් පේන්ටර් ශිල්පියා ය. (4) මයිකල් ආන්ජලෝ ශිල්පියා ය.

- **අංක 16 සිට 20 දක්වා දී ඇති වචනවල අර්ථය පැහැදිලි වන සේ සම්පූර්ණ වාක්‍යය බැගින් ලියන්න.**

(16) නියපොතු වැඩ - .....

(17) ත්‍රිමාණ - .....

(18) ගණේෂ්වරාචාර්ය - .....

(19) පශුපති - .....

(20) පවලක්කාල් - .....

- අංක 21 සිට 25 දක්වා දී ඇති රූප සටහන්වලට කිසියම් සබඳතාවක් දක්වන රූප සටහන, ඉදිරියෙන් ඇති **A, B, C, D, E** යන රූප සටහන් අතුරෙන් තෝරා, එයට අදාළ ඉංග්‍රීසි අක්ෂරය ප්‍රශ්න අංකය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.

(21)  (.....)  A

(22)  (.....)  B

(23)  (.....)  C

(24)  (.....)  D

(25)  (.....)  E

- **ප්‍රශ්න අංක 26 සිට 30 දක්වා දී ඇති එක් එක් වාක්‍යය, හිස්තැනට සුදුසු වචනය / වචන යොදා සම්පූර්ණ කරන්න.**

(26) ''මීඩම්හි පාත්තයෝ'' සිතුවම ක්‍රි. පූ. 2630 ට පමණ අයත් ඊජිප්තු ..... යුගයට අයත් නිර්මාණයකි.

(27) ''රබන් වයන්නා'' නමැති පනේල ලී කැටයම ..... නම් ස්ථානයේ දක්නට ඇති විශිෂ්ට නිර්මාණයකි.

(28) ශ්‍රී ලාංකික ජනතාවගේ මුදුන් මල්කඩක් බඳු වූ ශ්‍රී දළදා මාළිගාව තුළ ඇති සුවිශේෂී ම ගෘහ නිර්මාණ අංගය වන්නේ ..... යි.

(29) ''සිදුහත් කුමරු හා මව් බිසව'' (ලිතෝ මුද්‍රිත) සිතුවමෙහි, පුනරුද යුගයේ චිත්‍ර ශිල්පීන් අඳින ලද මරියතුමිය හා ජේසු බිළිඳා දැක්වෙන ..... චිත්‍රවල ආභාසය දැක ගත හැකි ය.

(30) වර්තමාන ජාතික කොඩිය වශයෙන් භාවිත කරන තීරු සහිත කොඩිය 1949 වර්ෂයේ දී ..... ශිල්පියා විසින් නිර්මාණය කර ඇත.

- අංක 31 සිට 35 දක්වා දී ඇති ප්‍රශ්නවලට **F, G, H, I, J** යන රූප සටහන් ඇසුරින් පිළිතුරු සපයන්න.



F G H I J

(31) F අක්ෂරයෙන් දැක්වෙන රූපයේ ඇති නිර්මාණ අයත් වන පාරම්පරික කලාව කුමක් ද?

.....

(32) G අක්ෂරයෙන් දැක්වෙන කැටයම් නිර්මාණය හඳුන්වන නම කුමක් ද?

.....

(33) H අක්ෂරයෙන් දැක්වෙන සිතුවම දක්නට ඇති ස්ථානය කුමක් ද?

.....

(34) I අක්ෂරයෙන් දැක්වෙන නිර්මාණය හඳුන්වන නම කුමක් ද?

.....

(35) J අක්ෂරයෙන් දැක්වෙන නිර්මාණය ප්‍රදර්ශනයට තබා ඇති ස්ථානය කුමක් ද?

.....

- **පහත දක්වා ඇති චිත්‍රය හඳුනාගෙන එහි කලාත්මක අගය විග්‍රහ කෙරෙන පරිදි අංක 36 සිට 40 තෙක් දී ඇති උප මාතෘකාවලට අදාළව අර්ථවත් වාක්‍ය 5 ක් ලියන්න. (පිළිතුරු විස්තරාත්මක වාක්‍යයකින් දැක්වීම අනිවාර්යය වේ. එසේ නොමැති පිළිතුරු සඳහා ලකුණු නොලැබේ.)**



(36) හඳුනාගත් බව :- .....

:- .....

(37) ශිල්පියා :- .....

:- .....

(38) මාධ්‍ය :- .....

:- .....

(39) වර්ණ භාවිතය :- .....

:- .....

(40) ආභාසය :- .....

:- .....

(ලකුණු 40)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

**තෙවන වාර පරීක්ෂණය - 2025**
**Third Term Test - 2025**

**10 ශ්‍රේණිය**

# චිත්‍ර - II

**කාලය පැය 02 යි**

නම/ විභාග අංකය:

**සැලකිය යුතුයි.**

- ★ ඔබේ **විභාග අංකය , පංතිය** උත්තර පත්‍රයේ **පසු පිටේ** පැහැදිලි ව සටහන් කරන්න.
- ★ උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට වියළී තිබිය යුතු ය. තෙත සහිත චිත්‍ර එකට ඇලී තිබීම ඔබට අවාසිදායක විය හැකි ය.
- ★ දිය සායම්, පෝස්ටර් සායම්, පැස්ටල් හෝ අතේ නොගෑවෙන ඕනෑ ම වර්ණ මාධ්‍යයක් භාවිත කළ හැකි ය.
- ★ සියලුම ද්‍රව්‍ය ඇස්මට්ටමින් පහළ සිටින සේ තැබීමට ශාලාධිපතිවරුන්ට උපදෙස් දී ඇත. එසේ නොතැබූ අවස්ථාවක් වුවහොත්, ඇඳීම පටන් ගැනීමට පෙර, විභාග ශාලාධිපතිට දැන්වීමට ඔබට අවසර තිබේ.

---

## නිදහස් රේඛාමය ඇඳීම හා වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය

★ ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කොට, චිත්‍රය නිර්මාණය කරන්න.

1. රේඛා මගින් පූර්ව අධ්‍යයනයක යෙදෙන්න. මේ සඳහා රළු කඩදාසියක් භාවිත කරන්න.
2. ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන අයුරින් ඇඳ වර්ණ කරන්න.

★ **මෙම චිත්‍ර දෙක ම එකට අමුණා විභාග ශාලාධිපතිට භාර දෙන්න.**

★ ඔබේ චිත්‍රය ඇගයීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමුකරන බව සලකන්න.

- **රේඛා අධ්‍යයනය**
  1. මුල් කඩදාසියේ කරනු ලබන පූර්ව අධ්‍යයනයේදී දක්වන කුසලතා
- **වර්ණ චිත්‍රය**
  2. ද්‍රව්‍ය සමූහය තලය මත කලාත්මක ව සම්පිණ්ඩනය වීම.
  3. පරිමාණ, පර්යාලෝක රීති හා ත්‍රිමාණ ලක්ෂණ පිළිබඳ අවබෝධය.
  4. දෙන ලද ද්‍රව්‍ය සමූහයේ මතුපිට ස්වභාවය හා ගති ලක්ෂණ දැක්වීම.
  5. වර්ණ හැසිරවීමේ ශිල්පීය කුසලතාව
  6. උචිත පසුබිමක් යෙදීම හා සමස්ත නිමාව

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 2025
Third Term Test - 2025

10 ශ්‍රේණිය

චිත්‍ර - ශාලාධිපති උපදෙස්

## නිදහස් රේඛාමය ඇඳීම හා වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය

**ශාලාධිපතිට උපදෙස්**

- පහත දක්වා ඇති ආකාරයට ද්‍රව්‍ය සම්පිණ්ඩනය සකස් කරන්න.
- ඇස් මට්ටමෙන් පහළ සිටින සේ ද්‍රව්‍ය සමූහය තබන්න.

**යෝජිත ද්‍රව්‍ය**

01. සුදු කඩදාසියකින් ආවරණය කරන ලද හිස් පෙට්ටියක්
02. කුඩා වීදුරුවක්
03. කොළ 4 ක් සහ මලක් සහිත අරලිය අත්තක්
04. නිල් පැහැති රෙදි කැබැල්ලක්
05. තැඹිලි ගෙඩියක්
06. හිස් ලීටර එකේ තීන්ත ටින් එකක්
07. භාණ්ඩ තැබීමට සුදුසු ආධාරකයක්



සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

**තෙවන වාර පරීක්ෂණය - 2025**
**Third Term Test - 2025**

**10 ශ්‍රේණිය**

# චිත්‍ර - III

**කාලය පැය 02 යි**

නම/ විභාග අංකය:

සැලකිය යුතුයි

- ඔබ ඇඳිය යුත්තේ එක් චිත්‍රයක් පමණි.
- ඔබේ විභාග අංකය, පංතිය හා අදාළ ප්‍රශ්න අංකය උත්තර පත්‍රයේ පසු පිටෙහි පැහැදිලිව ලියන්න.
- උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාරදෙන විට වියළී තිබිය යුතුය.
- දිය සායම්, පෝස්ටර් සායම්, පැස්ටල් ඇතුළු අතේ නොගෑවෙන ඕනෑම වර්ණ මාධ්‍යයක් වර්ණ කිරීමට භාවිත කළ හැකිය. (මකන දියර භාවිතය සුදුසු නැත.)
- ඇඳීමට සුදු කඩදාසි හා අවශ්‍ය අයට ටිෂූ කඩදාසි සපයනු ලැබේ. (ජාතික මට්ටමේ විභාගයේ දී පමණි. පළාත් මට්ටමේ දී තමන් විසින් සපයාගත යුතුය.)

---

- 'අ' කොටසින් හෝ 'ආ' කොටසින් හෝ 'ඉ' කොටසින් හෝ එක් මාතෘකාවක් පමණක් තෝරා වර්ණවත් චිත්‍රයක් නිර්මාණය කරන්න.

## "අ" කොටස - ප්‍රකාශන චිත්‍ර

(01) මාළු අස්වැන්නෙන් තෘප්තිමත් වූ ධීවරයෝ

(02) ප්‍රීතිමත් අවස්ථාවක්

(03) වනාන්තරයක දිය කඩිත්තක් අසල ගැවසෙන වන සතුන්

(04) ජනාකීර්ණ වීථියක්

## ''ආ'' කොටස - මෝස්තර නිර්මාණය

(05) කලා උළෙලකට සුදුසු පතාකයක් නිර්මාණය කරන්න.

(06) සාම්ප්‍රදායික සත්ව රූප ඇසුරින් සරම් වාටියක් නිර්මාණය කරන්න.

(07) ස්වභාවික මලක් සහ කොළයක් භාවිත කරමින් ව්‍යාප්ත මෝස්තරයක් අඟල් 9 x 9 ප්‍රමාණයට නිර්මාණය කරන්න.

## ''ඉ'' කොටස - ග්‍රැෆික් චිත්‍ර

(08) අලුතින් හඳුන්වා දෙන අධ්‍යාපන ආයතනයකට ලාංඡනයක් නිර්මාණය කරන්න.

(09) අලුත් අවුරුදු කාලයේ ගැයෙන කවියකට හෝ ගීතයකට සන්නිදර්ශන චිත්‍රයක් නිර්මාණය කරන්න.

(10) ළමා පොතක් සඳහා සුදුසු පොත් පිටකවරයක් නිර්මාණය කරන්න.

Past Papers Wiki



## පිළිතුරු පත්‍රය - I පත්‍රය (ලිඛිත)

(01) ලංකාතිලක විහාරය
(02) පැත්හල්ගල
(03) ස්ථපතිරායර්
(04) ගඩොල් සහ හුණු බදාම
(05) ධ්‍යාන
(06) සෝලියස් මෙන්ඩිස්
(07) චතුර්නාරි පල්ලැක්කිය
(08) මහනුවර දළදා මාලිගය
(09) හරප්පාවෙන්
(10) තිරියාය වටදාගෙය
(11) 3 මාරපරාජය
(12) 2 විජයෝත්පාය
(13) 1 රෆායල් සන්සියෝ
(14) 4 ඉන්දු
(15) 2 ලියනාඩෝ ඩාවිංචි
(16) නියපෝත්ත භාවිත කර ලාක්ෂා මගින් භාණ්ඩ අලංකාර කිරීම නියපොතු වැඩ නමින් හඳුන්වයි.
(17) දිග පළල සහ උස මතුවන සේ වස්තුවක් සිතුවම් කිරීම.
(18) ගඩලාදෙනිය විහාරයේ නිර්මාණ ශිල්පියා වේ.
(19) ඉන්දු නිමින ශිෂ්ටාචාරයෙන් හමු වූ අං සහිත දෙවියා මූර්තිය පශුපති නමින් ද හඳුන්වයි.
(20) මැද්ජම් රථයේ ඉහළ කොටස හා පහළ කොටස සම්බන්ධ කර ඇති කණු වේ.

(21) C (22) E (23) A (24) B
(25) D (26) පැරණි රාජධානි (27) ඇම්බැක්ක දේවාලය (28) පත්තිරිප්පුව
(29) මැඩෝනා (30) එස්. පී. චාර්ල්ස් (31) ලාක්ෂා (32) හංස පූට්ටුව

(33) සට්ටනාදර් ශිව දේවාලයේ
(34) නවනාරී කුඤ්ජරය
(35) ප්‍රංශයේ ලූවර් කෞතුකාගාරයේ
(36) ඉහත රූපය නායිකා චිත්‍ර ලෙස හඳුන්වයි.
(37) ජෝර්ජ් කිට් ශිල්පියා විසින් නිර්මාණය කර ඇත.
(38) මෙම සිතුවම තෙල් සායම් මාධ්‍යයෙන් කැන්වසය මත කරන ලද චිත්‍ර නිර්මාණයක් වේ.
(39) අඳුරු වර්ණ මෙන් ම පැහැදිලි දීප්තිමත් වර්ණ එකට සංකලනය කර වර්ණවත් කර තිබීම මෙම නායිකා සිතුවම්වලින් දැකිය හැකි ය.
(40) මෙම කලා නිර්මාණ සඳහා ආභාස වශයෙන් බටහිර සනිකවාදී කලා ලක්ෂණ මෙන් ම හින්දු දර්ශනයේ තන්ත්‍රයාන ලක්ෂණ ද ලැබී ඇතැයි විචාරක මතය යි.

පිළිතුරු පත්‍රය I පත්‍රය - 1 x 40 = 40

## II පත්‍රය - ස්වාභාවිකත්ව අධ්‍යයනය හා ද්‍රව්‍ය සම්පිණ්ඩනය ලකුණු දීමේ නිර්නායක

(1) රේඛා අධ්‍යයනය - ලකුණු 05
(2) ද්‍රව්‍ය සමූහය තලය මත අර්ථවත් සංචරනය කිරීමේ හැකියාව - ලකුණු 05
(3) ද්‍රව්‍යයන්ගේ පරිමාණ හා ස්වභාවය ප්‍රකාශ කිරීමේ හැකියාව - ලකුණු 05
(4) සිද්ධාන්ත භාවිතය පිළිබඳ අවබෝධය
(පර්යාවලෝකය ත්‍රිමාණ ලක්ෂණ ඇස් මට්ටමක අවකාශ භාවිතය) - ලකුණු 05
(5) වර්ණ භාවිතය හා ගති ලක්ෂණ දැක්වීම - ලකුණු 05
(6) චිත්‍රයේ පසුතලය ඇතුළු සමස්ත නිමාව - ලකුණු 05

**II** වන ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණු - ලකුණු 30

PAST PAPERS WIKI

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

## III පත්‍රය - "අ"කොටස - චිත්‍ර සංරචනය

**ලකුණු දීමේ නිර්ණායක**

(1) තෝරාගත් මාතෘකාව ප්‍රකාශ කිරීමේ දී ඊට උචිත වාතාවරණය හා ප්‍රකාශනය කර ඇති අයුරු - ලකුණු 06

(2) මානව රූප හා සත්ත්ව රූ ඇතුළු සියලු හැඩතල තලය මත සම්පිණ්ඩනය කර ඇති අයුරු - ලකුණු 06

(3) සිද්ධාන්ත භාවිතය (ත්‍රිමාණ ලක්ෂණ, පර්යාවලෝකය, පරිමාණය) - ලකුණු 06

(4) වර්ණ භාවිතයේ කුසලතා - ලකුණු 06

(5) අනුමත ශෛලියට අනුව චිත්‍රයේ සමස්ත නිමාව - ලකුණු 06

මුළු ලකුණු - **ලකුණු 30**

## III පත්‍රය "ආ"කොටස - මෝස්තර හා සැරසිලි නිර්මාණය

**ලකුණු දීමේ නිර්ණායක**

(1) මාතෘකාවට හා කාර්යයට උචිත අයුරින් නව්‍යතාවයකින් යුතුව සැලසුම් කිරීම. - ලකුණු 06

(2) පාරිභාරික අවශ්‍යතාවන්ට ගැළපෙන බව. - ලකුණු 06

(3) නිර්මාණාත්මක බව හා හැඩතල සම්පිණ්ඩනය කිරීමේ හැකියාව - ලකුණු 06

(4) උචිත වරණ තෝරාගෙන භාවිත කිරීමේ හැකියාව - ලකුණු 06

(5) විචිත්‍රත්වය, චමත්කාර ජනක බව, සමස්ත නිමාව - ලකුණු 06

මුළු ලකුණු - **ලකුණු 30**

## III පත්‍රය "ඉ"කොටස - ග්‍රැෆික් චිත්‍ර

**ලකුණු දීමේ නිර්ණායක**

(1) මාතෘකාවට අදාළ නිර්මාණ කාර්යයට උචිත අයුරින් සැලසුම් කිරීම. - ලකුණු 06

(2) වාණිජමය හා කර්මාන්තයට උචිත අයුරින් සැලසුම් කිරීම. - ලකුණු 06

(3) රේඛා හා හැඩතල හා සැරසිලි අර්ථවත්ව භාවිත කිරීමේ හැකියාව - ලකුණු 06

(4) උචිත වර්ණ තෝරාගෙන භාවිත කිරීම. - ලකුණු 06

(5) විචිත්‍රත්වය, චමත්කාරය හා සමස්ත නිමාව. - ලකුණු 06

මුළු ලකුණු - **ලකුණු 30**

| | | | | |
|---|---|---|---|---|
| **(i)** | - | පත්‍රය සඳහා - ලකුණු | = | 40 |
| **(ii)** | - | පත්‍රය සඳහා - ලකුණු | = | 30 |
| **(iii)** | - | පත්‍රය සඳහා - ලකුණු | = | 30 |
| | | මුළු ලකුණු | = | 100 |

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank